Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 43 S I |
|---|---|---|

**චිත්‍ර කලාව** — **කාලය පැය එකයි**

**නම හා විභාග අංකය :**

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිලිතුරු සපයන්න.

● **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා පහත දැක්වෙන රූපය ඇසුරු කරගෙන හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**



01. ඉහත දැක්වෙන්නේ ........................................................................ යුගයට අයත් නිර්මාණයකි.

02. විශේෂිත බෞද්ධ ගෘහ නිර්මාණය අංගයක් වන මෙම නිර්මාණය ........................................................................ නමින් හඳුන්වයි.

03. මෙම ගෘහ නිර්මාණය ........................................................ ස්ථූප අව් වැසි වලින් ආරක්ෂා කිරීම සඳහා ඉදිකොට ඇත.

04. ........................................................................................ මළු 2 කින් සමන්විත මෙම ගෘහ නිර්මාණයෙහි වහළය එයට අනුකූල වන අයුරින් නිමවා ඇත.

05. මෙම ගෘහ නිර්මාණය .............................................................. නමින් ද හඳුන්වයි.

★ **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

06. පරිගණක තාක්ෂණය යොදා ගනිමින් හැඩතල සජීවීකරණයට ලක් කිරීමෙන් සිදු කරන කලා අංගය කුමන් නමින් හැඳුන්වයිද?

........................................................................................

07. පිත්තල කර්මාන්තයේ දී නිර්මාණය කරන වාත්තු වැඩ ගණයට අයත් භාණ්ඩයක් නම් කරන්න.

........................................................................................

08. හින්දු කෝවිල් ආශ්‍රිත සිදු කරන විවිධ උත්සව සඳහා භාවිතයට ගන්නා දැව වාහන කුමන නමින් හඳුන්වයි ද?

........................................................................................

09. පාරම්පරික සැරසිලි නිර්මාණ අතර දැකිය හැකි පංචනාරිඝටය ඇත්දත් මාධ්‍යයෙන් නිර්මාණය කර ඇති ස්ථානයක් නම් කරන්න. ........................................................................................

10. ඉන්දියාවේ සාංචි ස්ථූපයේ හර්මිකාව නම් අංගය ලංකාවේ ස්ථූපයේ කුමන අංගයට සමානකමක් දක්වයිද?

........................................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

.

★ **අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා සුදුසුම නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

11. හින්දු ලෝකඩ මූර්ති නිර්මාණවල සමස්ත ප්‍රකාශනය සංකේතාත්මකව දැක්වීමට යොදාගෙන ඇත්තේ,
    1. ආසන ක්‍රමයයි  2. මුද්‍රා වර්ගයි  3. ත්‍රිභංග ලක්ෂණයයි.  4. පද්ම පීඨයයි

12. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර පිළිබඳව සත්‍ය කියමන තෝරන්න.
    1. සියළුම සිතුවම් එකම ශිල්ප ක්‍රමයට අනුව ඇඳ ඇත.
    2. සෑම සිතුවමක් ම වර්ණ ගන්වා ඇත.
    3. කළු හා සුදු වර්ණ පමණක් භාවිතයට ගෙන ඇත.
    4. ගල් බිත්තිය තුළ සත්ව රූප , මානව රූප, ජ්‍යාමිතික හැඩතල විවිධ සංකේත ඇඳ ඇත.

13. පොස්ටර් චිත්‍රයක් නිර්මාණයේ දී තිබිය යුතුම ලක්ෂණයක් වන්නේ,
    1. දුටු සැණින් දෙන පණිවිඩය හොඳින් අවබෝධ වීම.
    2. ආකර්ශනීය බවින් යුක්ත වීම.
    3. දෙන පණිවිඩය පැහැදිලිව දැක්වීම.
    4. ලබා දෙන පණිවිඩය සරල වීම.

14. ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කිරීමේ දී ඔබ විසින් සිදු නොකළ යුතු කරුණක් වන්නේ,
    1. නිවැරදි මිනුම් ක්‍රම භාවිතයෙන් ව්‍යාප්තිය සැළසුම් කිරීම.
    2. මෝස්තර ඒකකයක් නිර්මාණය කිරීම.
    3. මෝස්තර එකකයත් හෝ දෙකක් නැවත නැවත යෙදීම.
    4. ඔබ අඳින කඩදාසියේ මධ්‍යයෙහි සිට මෝස්තරය විහිදෙන අයුරින් නිර්මාණය කිරීම.

15. විසංගත වර්ණ 2 ක් වන්නේ,
    1. රතු - කහ  2. නිල් - රතු  3. රතු - කොළ  4. නිල් - කහ

★ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

16. ඉස්ලාම් ආගමික සිද්ධස්ථානවල වහළයෙහි ඇණු ගෙඩියක ආකාරයට නිර්මිත අංගය .......................................... නමින් හඳුන්වයි.

17. පෞරාණික ගොඩනැගිලි වල පියගැට පෙළ අලංකාර කිරීම සඳහා ..................................................................... අංග යොදාගෙන ඇත.

18. ........................................................................................ නම් ශිල්පියා 1951 දී පුවත්පත් මාධ්‍ය ඔස්සේ ප්‍රථම වරට නීලා නම් චිත්‍ර කතාව නිර්මාණය කොට ඇත.

19. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතර දැකිය හැකි සතෙකු පිට යන මිනිසා යන සිතුවම ........................... ලෙනෙහි දැකිය හැක්කේ,

20. අනුරාධපුර යුගයේ කොරවක් ගල නිර්මාණය සඳහා ............................... සංකල්පය යොදා ගෙන ඇත.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

★ අංක 21- 25 දක්වා ප්‍රශ්න සඳහා පහත ලබාදී ඇති A B C D E රූප සටහන් ඇසුරු කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.







A B C D E

21. A අක්ෂරයේ දැක්වෙන භාණ්ඩ කුමන පාරම්පරික කලාවකට අයත් වේද?

..........................................................................................

22. B අක්ෂරයේ දැක්වෙන පාරම්පරික වෙස් මුහුණු කලාව සඳහා යොදා ගන්නා ලී වර්ග මොනවාද?

..........................................................................................

23. C රූපයෙන් දැක්වෙන දේව රූවේ පහතට යෙදූ අතේ දැක්වෙන මුද්‍රාව කුමක්ද?

..........................................................................................

24. D රූපයෙන් දැක්වෙන වාහල්කඩ සතරෙහි ගල් කණු මත නිරූපිත සත්ව රූප මොනවාද?

..........................................................................................

25. E රූපයේ දැක්වෙන ස්තූපය මුල් කාලීනව කුමන හැඩයකට අනුව නිර්මාණය කොට ඇත් ද?

..........................................................................................

★ **අංක 26- 30 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

26. උඩරට ප්‍රදේශයේ ජනයා විවිධ ඇදහිලි විශ්වාස මත පදනම් ව ලෙඩරෝග සුවකිරීම හා සශ්‍රීකත්වය උදෙසා සිදුකරන ශාන්ති කර්මය කුමක් ද?

..........................................................................................

27. මැටි කලා කර්මාන්තයේ භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගන්නා ශිල්ප ක්‍රමයක් නම් කරන්න.

..........................................................................................

28. බෞද්ධ ප්‍රතිමා කලාවේ සෑම බුද්ධ ප්‍රතිමාවක ආසනයක් මත පිහිටුවා ඇත. එසේ නිර්මාණය වූ ආසන වර්ග දෙක නම් කරන්න.

..........................................................................................

29. තෙලීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගනිමින් ඉතා පහසුවෙන් උන්නත කැටයම් නිර්මාණයට සුදුසු මාධ්‍යයක් නම් කරන්න.

.......................................................................................... ..........................................................................................

30. ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය සඳහා භාවිතා කොට ඇති වර්ණ හා සංකේත මගින් යම් අර්ථයක් නිරූපනය වන අතර, සිංහයා අතරැදි අසිපතින් කුමක් සංකේතවත් කරයි ද?

..........................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

★ අංක 31-35 දක්වා ලබාදී ඇති වචනවල අර්ථය පැහැදිලි කිරීමට කෙටි වාක්‍යය බැගින් ලියන්න.

31. සෙංකෝලය :- ..........................................................................

..........................................................................

32. කැලියෝග්‍රැෆි :- ..........................................................................

..........................................................................

33. සාදලිගංම් :- ..........................................................................

..........................................................................

34. කුදිරෙයිවාහනම් :- ..........................................................................

..........................................................................

35. හේරුඩ පක්ෂියා :- ..........................................................................

..........................................................................

★ **අංක 36-40 දක්වා ප්‍රශ්න සඳහා පහත ලබාදී ඇති පින්තූරය හඳුනා ගෙන ලබාදී ඇති උපශීර්ෂ වලට අදාළව සම්පූර්ණ වැකියකින් පිළිතුරු සපයන්න.**



36. හැඳින්වීම :- ..........................................................................

..........................................................................

37. හමුවන ස්ථානය :- ..........................................................................

..........................................................................

38. මාධ්‍යය :- ..........................................................................

..........................................................................

39. ශිල්ප ක්‍රමය :- ..........................................................................

..........................................................................

40. ශිල්පීය දක්ෂතාවය :- ..........................................................................

..........................................................................

( ලකුණු 40 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 43 S II

චිත්‍ර කලාව | කාලය පැය 2 විනාඩි 30

## II කොටස

★ නිදහස් රේඛාමය අධ්‍යයනය
ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කර රේඛා මාධ්‍යයෙන් ද්‍රව්‍ය සමූහය ඇඳ පහත ලක්ෂණ නිවැරදිව අඳින්න.

1. මනාව සම්පිණ්ඩනය.
2. පරිමාණ ලක්ෂණ.
3. පර්යාවලෝක ලක්ෂණ.
4. එළිය අඳුර හා ත්‍රිමාණ ලක්ෂණ.
5. පෙරබිම් හා පසුබිම වෙන් කොට දක්වන්න.

මේ සඳහා ඔබට පැන්සල , පෑන හෝ එක වර්ණයක් ප්‍රභේද ලෙස පැස්ටල් මාධ්‍යද භාවිතා කළ හැක.

(ලකුණු 20)

ද්‍රව්‍ය කට්ටලය :-

✦ අලියා බීම බෝතල්

✦ ක්‍රෝටන් අත්තක් (කොළ 3 ක්)

✦ පෙට්ටියක් (ඝනකාභ හැඩැති)

✦ ටෙනිස් බෝලයක්

## III කොටස

★ **"අ", "ආ" සහ "ඇ" නමින් කොටස් 3 ක් ඇති අතර, ඉන් එක් කොටසකින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.**

★ **මේ සඳහා ඔබට පැස්ටල්, දියසායම්, පෝස්ටර් සායම් භාවිතා කළ හැක.**

**"අ" කොටස - චිත්‍ර සංරචනය**
1. ආගමික උත්සව අවස්ථාවකට සහභාගී වන බැතිමතුන්
2. වෙළඳපොළක ඔබ සිත්ගත් කොටසක්
3. බියට පත් වූ මුව රංචුවක්
4. සවස නිවස බලා යන ගොවියෝ ගෙවිලියෝ

**"ආ" කොටස - මෝස්තර නිර්මාණ**
1. කුෂන් කවරයකට සුදුසු මෝස්තරයක්
2. පළතුරු හැඩ ඇසුරින් මේස රෙද්දකට සුදුසු මෝස්තරයක්
3. ජ්‍යාමිතික හැඩතල හා මල් හා කොළ රටා ඇසුරු කරගනිමින් තිර රෙද්දකට සුදුසු මෝස්තරයක්

**"ඇ" කොටස - ග්‍රැෆික් චිත්‍ර**
1. "ජල සම්පත සුරකිමු" මැයෙන් පෝස්ටරයකට සුදුසු නිර්මාණයක්
2. ඔබේ පාසලේ ක්‍රීඩා උත්සවය සඳහා යොදාගත හැකි ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.
3. "ගමරාළ දිව්‍ය ලෝකේ ගිය හැටි" නම් කතාන්දර පොතට සුදුසු පිටකවරයක් නිර්මාණය කරන්න. (ලකුණු 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

09 ශ්‍රේණිය

# තෙවන වාර පරීක්ෂණය - 2019

චිත්‍ර කලාව

## පිළිතුරු පත්‍රය

**I** කොටස

01. පොළොන්නරුව.
02. වටදාගෙය.
03. කුඩා.
04. වෘත්තාකාර.
05. චෛතියඝර/ සෑගෙය/ දාගෙය.
05. කාටුන්.
07. කොත්/ පහන්/ පාත්‍රා/ මල්පොච්චි.
08. මරවාහනම්.
09. ඇම්බැක්ක දේවාලය.
10. හතරැස් කොටුව.
11. 2
12. 4
13. 1
14. 4
15. 3
16. කුම්භා / කූෆා.
17. වාමන රූප/ වජ්‍ර සංකේත.
18. ජී.එස්. ප්‍රනාන්දු.
19. තන්තිරිමලේ.
20. මකර.
21. ලාක්ෂා.
22. වෙල්/කදුරු/ රුක්අත්තන.
23. ගජහස්ත මුද්‍රාව.
24. අත්, අස්, ගව, සිංහ.
25. ධාන්‍යාකාර.
26. කොහොඹා කංකාරිය.
27. අත් සකපෝරුව/ පා සකපෝරුව/ මැටි පුවරු තැලීමෙන්.
28. වජ්‍රාසනය/ පද්මාසනය.
29. සෘජුපෝම්.
30. පරමාධිපත්‍යය.
31. සෙංකෝලය - පාර්ලිමේන්තුවේ කතානායකවරයා සතු අධිකාරි බලය අඟවන යෂ්ටියක් බඳු නිර්මාණයකි.
32. කැලියෝග්‍රෆි - ඉස්ලාම් ආගමේ මස්ජිදය තුළ අරාබි අක්ෂර වලින් රටාවකට ලියන ලද දේව වැකි.
33. පාරම්පරික ශිල්පීන් රතු වර්ණය සාදා ගැනීමට ඉන්දියාවෙන් ගෙන්වූ ඛනිජ විශේෂයකි.
34. හින්දු ආගමික උත්සව සඳහා භාවිතා කරන දැවයෙන් නිම කළ අශ්ව රථ.
35. පාරම්පරික සැරසිලි අතර ඇති හිස් දෙකක් සහිත කල්පිත සත්ව රූවකි.
36. මෙයින් දැක්වෙන්නේ අනුරාධපුර යුගයට අයත් සඳකඩ පහනකි.
37. මෙම සඳකඩ පහන රත්න ප්‍රසාදයට අයත් වේ.
38. සඳකඩ පහන නිමවා ඇත්තේ කළුගල් මාධ්‍යයෙනි.
39. මෙය අල්ප උන්නත ශිල්ප ක්‍රමයට නිමවා ඇත.
40. ඉතා කුඩා තීරු තුළ ඉතා සියුම් ලෙස කැටයම් නිමවා ඇත. සත්ව රූප වලින් සත්තුන්ගේ ගති ලක්ෂණ හොඳින් මතුකොට දක්වා ඇත.